1. හැම කෙනාම ගැලවීමට ආ යුතුවේ.

"මක්නිසාද සියල්ලෝම පව්කොට දෙවියන්වහන්සේගේ මහිමයෙන් හීනව සිටිති." - රෝම 3:23

2. තමන් ගේ ගැලවීම තමන්ටම ලබාගත නොහැක.

ශුද්ධ වූ බයිබලයට අනුව
"අප විසින්ම කළාවූ ධර්මිෂ්ඨකමේ ක්‍රියාවලින් නොව තමන්වහන්සේගේ දයාව ලෙස නැවත ඉපදීම නැමති සේදීමෙන්ද ශුද්ධාත්මයාණන්වහන්සේගේ අලුත්කිරීමෙන්ද උන්වහන්සේ අප ගැළවූසේක. - තීතස් 3.5

3. අපට ආදේශකයක් අවශ්‍ය වේ.

(පාපයේ මිල ගෙවීමට යමෙක් අවැසි වේ). ශුද්ධ වූ බයිබලයට අනුව
"යේසුස්වහන්සේ උත්තරදෙමින්: දෙවියන්වහන්සේගේ වැඩය නම් උන්වහන්සේ විසින් එවූ තැනැත්තා කෙරෙහි නුඹලා විසින් අදහාගැන්මයයි කී සේක." - යොහාන් 6. 29
"මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේමකළ සේක. එසේ කලේ උන්වහන්සේ කෙරෙහි අදහාගන්න සැමදෙනම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය. "
- යොහාන් 3.16

4. ගැලවීමට තිබෙන එකම මාර්ගය යේසුස් වහන්සේ පමණි.

"වෙන කිසිවෙකු තුළ ගැළවීම නැත්තේය. මක්නිසාද අපේ ගැළවීමට අවශ්‍යවූ, මනුෂ්‍යයන් අතරේ දෙන ලද වෙන කිසි නාමයක් ස්වර්ගයෙන් යට නැත්තේයයි කීවේය" - ක්‍රියා 4.12

5. පව් වලට මනස්ථාපනය වී දෙවිඳුන් යදින්න.

මුළු හදින්ම දෙවියන් වහන්සේ ගෙන් ඉල්ලා සිටිය යුත්තේ ඔබව ගැලවීමට යොමු කරන ලෙසය.
"මක්නිසාද: ස්වාමීන්වහන්සේගේ නාමයට යාච්ඤා කරන කවුරු නුමුත් ගළවනු ලබන්නේය." – රෝම 10.13

" නුමුත් සුංගම් අයකරන්නා දුරින් සිට, ස්වර්ගය දෙසට ඇස් ඔසවා බලන්ටවත් නොසිතා, තමාගේ ළැපැත්තට ගසාගනිමින්: දෙවියන්වහන්ස, පව්කාරයෙක්වූ මට කරුණාකළ මැනවයි කීවේය."
ලූක් 18.13

6. ඔබේ ගැලවීම තහවුරු කර ගන්නේ කෙසේද ?

දේව වචනය කියවන්න. දෙවියන් වහන්සේ අනුගමනය කරන්න. විශ්වාසවන්තයා ගේ බෞතිස්මය කරුණු කොට ගෙන, බයිබලය විශ්වාසකරන , යේසුස් වහන්සේ ට මුල්තැන දෙන පල්ලියක් සොයා ගන්න. නිතිපතා මෙන්ම විශ්වාසයෙන් එහි යන්න.
(හෙබ්‍රෙව් 10.25)